## හෝමාගම ප්‍රාදේශීය සභාව.
## කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 1 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (i) 2018 වර්ෂයේදී ඉදිකරන ලද වටිනාකම රු.18,823,916 ක් වූ ගොඩනැගිලි 03ක පිරිවැය ගිණුම්ගතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරිමේදී ජනල් සටහනක් මගින් ප්‍රාග්ධනිත කරමි. |
| (ii) වර්ෂ 20 කට වඩා පැරණි හා පෙර වර්ෂවලදී වෙන්දේසි කරන ලද එකතු වටිනාකම රු.7,539,576ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත හා ලී බඩු සවිකිරීම්වල, වර්තමාන පැවැත්ම තහවුරු කර ගැනීමකින් තොරව ස්ථාවර වත්කම් ශේෂය තුල ඇතුලත්ව තිබුණි. | වත්කම්වල වර්තමාන භෞතික පැවැත්ම තහවුරු කරගෙන අනෙකුත් වත්කම්වල වටිනාකම් ඉවත් කළ යුතුවේ. | දැනට භෞතිකව නොමැති වෙන්දේසි මගින් ඉවත්කරන ලද භාණ්ඩවල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛණයෙන් ඉවත් කරමි. |
| (iii) මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයෙන් ලැබිය යුතු රු.69,300,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | මීලඟ අවසන් ගිණුම සැකසීමේදී එකී හිඟය ණය ගැතියෙකු ලෙස ඇතුලත් කරමි. |
| (iv) 2017 වර්ෂයේදී ලබාගත් කායවර්ධන උපකරණ වෙනුවෙන් ගෙවිය යුතු රු.9,706,300ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සලසාගත යුතුවේ. | පළාත් සභාවෙන් මුදල් ලැබුණු පසු ප්‍රවර්තන වර්ෂයේදී ගෙවීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (v) භෞතිකව නොමැති රු.22,595,256 ක් වටිනා ගබඩා භාණ්ඩ, ගබඩා තොග ගිණුමෙහි ඇතුලත්ව තිබුණි. | වර්ෂය අවසාන දිනට භෞතික තොග ශේෂය අගයකර ගිණුම්වල දැක්විය යුතුවේ. | ඉදිරියේ දී අවසන් ගිණුම සමග නිවැරදි තොග ගැලපුම් වාර්තාවක් ඉදිරිපත් කිරීමට සටහන්කර ගතිමි. |
| (vi) සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද විකුණුම් වටිනාකම රු.214,142 ක් වූ භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩවල ගත්මිල හදුනාගෙන ගිණුම්වලින් ඉවත්කළ යුතුවේ. | දැනට සිදුකරමින් පවතින තක්සේරුව සඳහා අනුමැතිය ලැබුණු පසු හදුනා ගැනීමට නොහැකි වූ අදාල වෙන්දේසි භාණ්ඩවල වටිනාකම ගිණුමින් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (vii) 2015 මාර්තු 25 දින සභා භූමිය තුල පිහිටි ලේඛනාගාර ගොඩනැගිල්ල ගිනි ගැනීමෙන් සිදු වූ පාඩුව රු.2,117,441ක් ලෙස තක්සේරු කර තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සියළුම තොරතුරු අනාවරණය කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව නොමැති බව පිළිගතිමි. ඉදිරියේදී අලාභය අයකර ගැනීමට කටයුතු සිදුකරන බව දැනුම් දෙමි. |
| (viii) අත්හැර දමන ලද කර්මාන්ත 03 ක් සඳහා රු.790,000 ක ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | මහජන ඉල්ලීම් සලකා බලා ගරු සභාපතිතුමාගේ උපදෙස් මත පුළුල් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන්ම කාපට් කිරීමට අවශ්‍ය බැවින් අවලංගු කර ඇත. |
| (ix) වෙළඳසැල් හා ව්‍යාපාරික ස්ථානවලින් දෛනිකව කසළ එකතු කිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.125,597 ක් ණයගැති ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් සංකල්ප අනුව අයවිය යුතු මුදල් ණයගැති ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී මෙම තොරතුරු ලබාදීමට කටයුතු කරමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බාහිර පාර්ශවයන් විසින් සභාවට විරුද්ධව පවරන ලද වටිනාකම රු.11,000,000 ක් වූ නඩු 09 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරියේදී එම තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ගිණුම් විෂයන් 03ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා ලේඛණ අනුව ශේෂ අතර රු.14,254,205ක වෙනස්කම් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් සකස් කිරීමේදී ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| ලැබිය යුතු ගිණුම් නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන භාරකාර මණ්ඩලය වෙත රු.300,000 වාර්ෂික බදු කුලියකට පවරා තිබූ අක්කර 01 රූඩ් 02 පර්චස් 10 ක වපසරයකින් යුත් ඉඩම් කොටස සඳහා 2013 වර්ෂයේදී කර තිබූ රු.900,000 ක් වූ නව තක්සේරු මුදල නොලැබීම හේතුවෙන් 2014, 2015, 2016, 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ බදු මුදල හා දඩ මුදල රු.69,300,000 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එකී හිඟ මුදල් ගෙවන ලෙස ආර්ථික මධ්‍යස්ථාන භාරය විටින් විට දැනුවත් කලද ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවක් මතු කරමින් ගෙවීම් පැහැර හැර ඇත. එහෙයින් ගිවිසුම් කඩකිරීම මත නඩු පැවරීමට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගන්නා ලෙස මුදල් කමිටුව තීරණය කර ඇත. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

තොරතුරු ඉදිරිපත් නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වටිනාකම රු.522,066,918ක් වූ ගිණුම් විෂයයන් 05කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/ සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඒ පිළිබඳ ඉදිරියේදී සොයා එවීමට කටයුතු කරමි. |

1.5 අනුකූල නොවීම.

------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------------

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | හෝමාගම කලාපයේ වසර 08 කට පෙර ලබා ගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | හෝමාගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වරිපනම් කලාප 02ක් ක්‍රියාත්මක වන අතර ඉන් වැතර කලාපයේ නව තක්සේරුවක් 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. හෝමාගම කලාපයේ තක්සේරුව අවසන් වරට 2011 වර්ෂයේදී සිදු කර ඇති අතර නව තක්සේරුවක් සිදු කිරීම සඳහා 2017.06.16 දින විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇත. ඉන් අනතුරුව අවස්ථා කීපයකදීම තක්සේරුව සිදුකරන ලෙස තකේස්රු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i)මු.රෙ 371 (5) | රු.42,600 ක්වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නිකුත් කල අත්තිකාරම් නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) මු.රෙ 571 | වර්ෂ 02ක ඉක්ම වු රු.4,123,817ක්වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | වැතර උප කාර්යාලයේ 2014, 2015, 2016 වර්ෂයන්හි තැන්පත් මුදල් මෙතෙක් ආදායමට ගෙන නැත. එම ආපසු නොගත් තැන්පත් මුදල් 2019 වර්ෂය තුලදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |

(ඇ) චක්‍රලේඛ හා ලිපි

| | | | |
|---|---|---|---|
| (i) 1985 මාර්තු 20 දිනැති ලිපි අංක දෙසැ/01 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | බිම් පරිමාණ අනුපාතය ඉක්මවීම හා අනවසර ඉදිකිරීම් වෙනුවෙන් අයකරන සේවා ගාස්තුවලින් සියයට 25ක් නාගරික සංවර්ධන අධිකාරියට යවා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පොදු කටයුත්තක් සම්බන්ධයෙන් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා ලබා ගන්නා අවස්ථාවේ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති /අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතියක් යටතේ ලබා ගන්නා බැවින් එම අවස්ථාවේදී එම 25%ක මුදල හැර ඉතිරි මුදල් පමණක් ලබා ගැනීමට ක්‍රියා කරන බව දන්වමි. |
| (ii) 1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින රු. 22,035,964ක්වූ මුදල් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | හෝමාගම බණ්ඩාරනායක ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එම මුදල් යොදා ගැනීමට අදහස් කර ඇත. එම ගොඩනැගිල්ලේ පිඹුරුපත් හා ගොඩනැගිලි සැලසුම් වල කටයුතු සිදු කෙරෙමින් පවතී. අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |
| (iii) 2012 අගෝස්තු 14 දිනැති අංක LGD/05/11 VOL V දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ගිනි නිවීමේ සේවාවන් ලබා ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ගිනි නිවීමේ සහය ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවෙන් යොමු කරන ලද කෙටුම්පත් ගිවිසුම් අනුමැතිය සඳහා 2018.10.08 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමුකල මුත් එකී ගිවිසුමේ 7 වන කොන්දේසියට මහා සභා අනුමැතිය නොලැබුණි. එබැවින් එකී කොන්දේසිය සංශෝධනයට යටත්ව සේවය ලබා ගැනීමට එකගවන බවට 2018.11.12 දිනැති ලිපියෙන් එම ආයතනය වෙත දැනුම්දුන් නමුත් මේ වන තෙක් පිළිතුරක් නොලැබුණි. එබැවින් ගිවිසුම්ගත වීමට කටයුතු නොකල බව දන්වමි. |
| (iv) 2012 ජුලි 11 වන දිනැති අංක WP/LGD/01/2012 බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ (vi), (vii) හා (viii) වගන්ති | සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි සැලසුම් අයදුම්පත් 16ක් චක්‍රලේඛය ප්‍රකාරව ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන අනුමැතිය ලබාදීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ක්ෂේත්‍ර පරීක්ෂාවන් සඳහා ඉදිරිපත් නොවී තිබූ අයදුම්පත් 16ක් අදාල ප්‍රදේශයන්ට බෙදා වෙන් කර තාක්ෂණ නිලධාරීන් වෙත යොමු කර සැලසුම් කමිටු සඳහා යොමු කරන ලෙස දැනුම්දී ඇති අතර ක්ෂේත්‍ර පරීක්ෂා කර සැලසුම් කමිටු සඳහා යොමු කර ඇත්තේ අයදුම්පත් 04ක් පමණි. |

| | | | |
|---|---|---|---|
| (v) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | කඩකුලී තක්සේරුව වසර 3කට වරක්වත් සිදුකළ යුතු වුවද වැතර උපකාර්යාලයට අයත් කඩ කාමර සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | කහතුඩුව වෙළද සංකීර්ණය හැර අනෙකුත් සියලුම කඩ කාමරවල තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.134,926,783 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.122,213,348 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | 2018 දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | 2017 දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 74,087,800 | 83,423,094 | 64,896,543 | 38,465,793 | 53,926,700 | 71,670,580 | 76,151,369 | 29,688,575 |
| (ii) කුලී | 11,366,700 | 17,320,143 | 6,438,464 | 269,202 | 12,618,791 | 11,502,847 | 11,861,422 | 393,302 |
| (iii) බලපත්‍ර ගාස්තු | 4,100,900 | 5,269,316 | 2,849,483 | - | 6,000,900 | 4,906,274 | 5,000,928 | - |
| (iv) වෙනත් ආදායම් | 152,741,000 | 172,537,005 | 281,429,139 | 103,570,628 | 381,735,026 | 244,922,680 | 376,228,139 | 162,665,062 |
| එකතුව | 242,296,400 | 278,549,558 | 355,613,629 | 142,305,623 | 454,281,417 | 333,002,381 | 469,241,858 | 192,746,939 |

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂයකට අඩු රු.4,919,071 ක් ද වර්ෂ 1,3 අතර රු.19,591,903 ක්ද, වර්ෂ 03,05 අතර රු.7,996,289 ක් සහ වර්ෂ 05 කට වැඩි රු.5,890,068 ක ශේෂයක්ද විය. | සභාවට අයවිය යුතු වරිපනම් බදු අප්‍රමාදව අයකර ගත යුතුවේ. | වරිපනම් හිඟ අයකර ගැනීම සඳහා මේ වන විට වරෙන්තු නිකුත් කර ඇති අතර ඊට අතිරේඛව වැතර කාර්යාලය බලප්‍රදේශය තුල ජංගම සේවා 06 ක් පමණ පවත්වා ඇත. ඉදිරියටත් ජංගම සේවා 08 ක් පැවැත්වීමට නියමිතය. ඊට |

| | | |
|---|---|---|
| | | අතිරේඛව ගෙයින් ගෙට ගොස් වරිපනම් බදු එකතු කිරීමේ වැඩසටහනක් හෝමාගම කාර්යාලයේ ක්‍රියාත්මකවේ. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.87,388,796 ක් හා මුද්දර ගාස්තු රු.16,181,832ක් විය. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2015 සිට 2017 වර්ෂය දක්වා රු.566,421,400 මුදලකට අදාල උපලේඛන සකස් කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉහත කී කාලය සඳහා මුද්දර ගාස්තු අත්තිකාරම් ලෙස රු.470,000,000 ක් ලැබී ඇත. එකී අත්තිකාරම් මුදලින් රු.62,064,110 ක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පියවා ඇත. 2014 වර්ෂය දක්වා සියළු මුද්දර ගාස්තු අයකරගෙන ඇත. |

2.2.4 පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර 15කට නව පරිසර බලපත්‍ර ලබාදී නොතිබූ අතර එමගින් රු.60,000ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | භෞතිකව පරීක්ෂා කර පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුවේ. | හේතුව<br>ව්‍යාපාර 05ක ස්ථානීය පරීක්ෂණය සඳහා තාක්ෂණ නිලධාරී වෙත යොමුකර ඇති අතර කඩිනමින් වාර්තාව ලබා ගැනීමට කටයුතු යොදා ඇත.<br>ව්‍යාපාරයක් පරීක්ෂණ සඳහා ම.සෞ.පරීක්ෂක වෙත යොමු කර ඇත.<br>ව්‍යාපාර 08ක අඩුපාඩු ගෙන්වා ගැනීමට ලිපි යවා ඇත.<br>ව්‍යාපාර 02ක පරිසර බලපත්‍ර ලබාදීම තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව මගින් ප්‍රතික්ෂේප කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත්, පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (i) වල්පිට "වින්ෆීල්ඩ් ගාඩ්න්" 4වන පටුමග, වසරකට වඩා අධික කාලයක සිට ගල්වැලි | බලප්‍රදේශයේ ප්‍රජාවට මාර්ග | වල්පිට වින්ෆීල්ඩ් ගාඩ්න් 4 වන පටුමග - බෑවුම් සහිත මෙම මාර්ගය දැඩි ලෙස අබලන්ව ගමන් |

| | | |
|---|---|---|
| අතුරා මාර්ගයේ වැඩ නිම නොකර අත්හැර දමා තිබුනි. | පහසුකම් සලසා දිය යුතුවේ. | කිරීමට අපහසුව තිබි ඇති බැවින් යම් පාර්ශවයක් විසින් ගමන් කිරීමට පහසු වන ලෙස මාර්ගය සකසා ගල් අතුරා ඇත. නමුත් ඒ වන විට මෙම මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් හෝ වෙනත් ආයතනයකින් ප්‍රතිපාදන වෙන් වී නොතිබිණි. තවද, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර නොහැකි වූ අතර ලිපිගොනුවක්ද ඒ වෙනුවෙන් විවෘත කර නොතිබිනි. එබැවින් කිසිම මූලාශ්‍රයකින් මේ සඳහා ගෙවීමක්ද කර නැත. |
| (ii) සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ඇස්තමේන්තුගත වටිනාකම රු.260,000 ක් වූ කර්මාන්තයක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | සැලසුම් සකස් කිරීමේදී මූල්‍ය, භෞතික හා ශ්‍රම සම්පත් ආදී සීමාකාරී සාධක පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | මහජන ඉල්ලීම් සලකා බලමින් ගරු සභාපතිතුමාගේ උපදෙස් මත පුළුල් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන්ම කාපට් කිරීමට අවශ්‍ය බැවින් අවලංගු කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත් වී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි. | 2030 න්‍යාය පත්‍රයට අනුව ක්‍රියාත්මක විය යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු<br>2018 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලයේ ද්විතීක මට්ටමේ පුරප්පාඩු 04 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 14ක් පැවතුණි. | අප්‍රමාදව සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | * ද්විතීක මට්ටමේ පවතින පුරප්පාඩු 04 සම්පූර්ණ කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) වෙත කාර්තු වාර්තා මගින් දන්වා ඇත.<br><br>* ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06ක් මේ වනවිට සම්පූර්ණ කර ඇත. ඉතිරි පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති හෙයින් ඉදිරියේදී නැවත අයදුම්පත් කැඳවීමට සිදුවේ. |

(ආ) සේවක ණය

| ---------------- | | |
|---|---|---|
| විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 36 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.2,431,265 ක් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි. | ණයකරුවන්ගෙන් හා ඇපකරුවන්ගෙන් අප්‍රමාදව අයකරගත යුතුවේ. | අය විය යුතු රු.2,431,265 ක ශේෂය අය කර ගැනීමට කටයුතු කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

-------------------------------

3.3.1 වත්කම් ලේඛණගත නොකිරීම.

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාවට අයත් ඉඩම් කට්ටි 18 ක් සඳහා වූ හිමිකම් ඔප්පු අස්ථානගත වී තිබුණි. | සියළුම ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබාගත යුතුවේ. | ඉදිරියේදී හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කරමි. |

3.3.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ජම්බුගස්මුල්ල ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ඉඩම වටා මායිම් වැටක් ඉදිකර නොතිබූ අතර අසල්වාසීන් විසින් ඉඩමේ ඉදිකිරීම් හා වගාවන් සිදුකර එම කොටස් ඔවුනට හිමිවන පරිදි මායිම් වැටක් ඉදිකර තිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | මිනින්දෝරු මහතකු මඟින් මිනුම් කර නිවැරදිව තහවුරු කර ගෙන අදාළ මායිම් වැට ඉදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) සභාවට අයත් මැදහේන වත්ත "සඳවිමන" පොදු පහසුකම් ඉඩමේ ආරක්ෂක වැට ඉදිකර නොතිබූ අතර මායිමට ඉතා ආසන්නයේ අනවසර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | අනවසර ඉදි කිරීම කඩා ඉවත් කරන ලෙසත් ඉදිකර ඇති ගොඩනැගිල්ල දින 14ක් තුළ අනුමත කර ගන්නා ලෙසත් දැනුම් දෙන ලදි. පොදු ඉඩම වටා ආරක්ෂිත වැටක් යෙදීමට ඇස්තමේන්තු සකස්කර ඇති අතර ඉඩම මැනීම සඳහා මිනින්දෝරු වාර්තාව 2018.05.03 දන්වා යවා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) පොදු පහසුකම් ලෙස සභාවට ලැබුණු අක්කර විස්ස සහන උයන (පර් 20) ඉඩම සහ ගලවිල වත්ත උපාලි ආයතනය ඉදිරිපිට පොදු ඉඩම පෞද්ගලික පාර්ශවයන් විසින් භුක්ති විඳිනු ලබන අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාකර නොතිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුවේ. | ඉඩම් පිළිබඳ අදාළ ලියවිලි පරීක්ෂාකර අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ඇත. |

3.3.3 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) එකතු වටිනාකම රු.6,020,250 ක් වූ මෝටර් ග්‍රේඩරයක් සහ විදුලි උත්පාදක යන්ත්‍රයක් සහ වටිනාකම සොයාගත නොහැකි වත්කම් 03 ක් නිශ්ක්‍රීයව / ඌන උපයෝජිතව පැවතුණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම හෝ සුදුස්සක්කර ඉවත්කළ යුතුවේ. | මෝටර් ග්‍රේඩරයක් සහ විදුලි උත්පාදන යන්ත්‍ර වෙන්දේසිකර ඉවත්කිරීමටත් ජල ටැංකි හා නාම පුවරු හඳුනාගත් ස්ථානවල සවිකිරීමටත් ඉතිරි වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කරමි. |
| (ආ) 2011 වර්ෂයේදී රු.3,248,058 ක වියදමක් දරා ඉදිකරන ලද පිටිපන නව පුස්තකාල දෙමහල් ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ඌණ උපයෝජිතව පැවතිණි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | කායවර්ධන මධ්‍යස්ථානයක්/ පුස්තකාලයක්/ සේවා පියසක් ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිතය. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) වැය විෂයයන් 134 ක් සඳහා සලසා තිබූ එකතුව රු.3,895,616ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබූ අතර වැය විෂයයන් 54ක් වෙනුවෙන් රු.13,007,429ක් වෙන්කර තිබුණද එයින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් වැයකර නොතිබුණි. එම ප්‍රමාණය රු.9,635,589 ක් විය. | අයවැය ලේඛනය ඵලදායී පාලන උපකරණයක් ලෙස භාවිතා කළ යුතුවේ. | වර්ෂය තුළ අපේක්ෂිත වියදම් සිදු නොවීම නිසා වැය ශීර්ෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවිය. වියදම් සිදුවෙතැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන වෙන්කලද අපේක්ෂිත වියදම් ඉටුනොවීම මත වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉතිරිවිය. |

4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |